# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2069/12 - 2018 මැයි මස 01 වැනි අඟහරුවාදා - 2018.05.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: KMB/LAN/ACQUI/02/65.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4-3/2/2012/HA/243.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවයේ විස්තරය:*

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 330 , කඹුරුපිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මු. පි. මාර 2719 හි පෙන්නුම් කරන පහත සඳහන් ඉඩම් කොටස:

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: රටලංකාවත්ත, කිරාගෙවිල; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0037.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: රටලංකාවත්ත ; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0029.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: රටලංකාවත්ත ; විස්තරය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0321.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 ජූනි මස 06 වැනි දින පූ. භා. 9.30ට කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2018 මැයි මස 30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එන්. එච්. එම්. ඩබ්. ඩබ්. එන්. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2018 අප්‍රේල් මස 24 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-433



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය*:* DS/GFG/L&L/5/2014/07.
ඉ/පා./ප්‍ර. අමා. අංකය*:* 4-3/12/2014/UD/239-A.

2016.08.25 දින නිකුත් කරන ලද අංක 1981/86 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල මහ නගර සභා සීමාව තුළ 101E, මලිගස්පේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මලිගස්පේ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 810019 දරන කැඩැස්තර පිඹුරේ කලාප 02 හි පත්‍ර 05 හි කැබලි අංක 352, 353, 354 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0275 ක් වූ පහත නම් වලින් හා මායිම් වලින් යුත් බිම් කොටස් සඳහා මායිම්-

01. කැබලි අංක 352

ඉඩමේ නම: හික්ගොඩවත්ත අද්දර කුඹුර *හෙවත්* ආඩිගෙවත්ත අද්දර කුඹුර; වරිපනම් අංක: සොයාගත නොහැක; හිමිකම් කියන අය: රජය; ඉඩම් පරිහරණය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා : සොයාගත නොහැක ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0068 ක් පමණ වේ.

02. කැබලි අංක 353

ඉඩමේ නම: හික්ගොඩවත්ත අද්දර කුඹුර *හෙවත්* ආඩිගෙවත්ත අද්දර කුඹුර; වරිපනම් අංක: සොයාගත නොහැක; හිමිකම් කියන අය: රජය; ඉඩම් පරිහරණය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා : සොයාගත නොහැක ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0096 ක් පමණ වේ.

03. කැබලි අංක 354

ඉඩමේ නම: හික්ගොඩවත්ත අද්දර කුඹුර *හෙවත්* ආඩිගෙවත්ත අද්දර කුඹුර; වරිපනම් අංක: සොයාගත නොහැක; හිමිකම් කියන අය: රජය; ඉඩම් පරිහරණය: ගෙවත්ත ; මුල් හිමිකම් පාන්නා : සොයාගත නොහැක ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0111 ක් පමණ වේ.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 මැයි මස 23 වැනි දින පූ. භා. 9.00ට ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2018 මැයි මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩබ්. එස්. සත්‍යානන්ද,
ප්‍රාදේශීය ලේකම්,
කඩවත් සතර - ගාල්ල.

ගාල්ල - කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-434

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.